# ආයුර්වේද වෛද්‍ය සභාව

## දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

## පාරම්පරික (ආයුර්වේද / සිද්ධ / යුනානි) වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචිය අපේක්ෂිත අයදුම්කරුවන් සඳහා පවත්වනු ලබන

# ලිඛිත හා වාචික පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවීම

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත පවරා ඇති බලතල ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්මතයනට අනුකූලව පාරම්පරික වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචිය ලබා ගැනීමට අපේක්ෂිත පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. මූලික සුදුසුකම්**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. ගුරු වෛද්‍යවරයා පාරම්පරික වෛද්‍යවරයෙකු විය යුතු අතර, ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා වසර දහයක් (10) සම්පූර්ණ වී තිබිය යුතුය. ආයතනික පුහුණුව ලත් උපාධිධාරී හෝ ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන්ට ගුරු වෛද්‍යවරයා විය හැක්කේ තමාගේම දූ දරුවන් සඳහා පමණි.

iii. සාමාන්‍ය (සර්වාංග) අංශය සඳහා සිය පරම්පරාවට අදාළ වෛද්‍ය කර්මය පිළිබඳ අවුරුදු පහක (05) කර්මාභ්‍යාසයක් සමග වයස අවුරුදු 28 ක් සම්පූර්ණ විය යුතුය.

iv. විශේෂ අංශයක් සඳහා සිය පරම්පරාවට අදාළ වෛද්‍ය කර්මය පිළිබඳ අවුරුදු හතරක (04) කර්මාභ්‍යාසයක් සමග වයස අවුරුදු 25 ක් සම්පූර්ණ විය යුතුය.

**02. අයදුම්පත නිකුත් කරනු ලබන ක්‍රමවේදය හා ගාස්තු ගෙවීම**

i. අයදුම්පත හා විෂය නිර්දේශය ඇතුළු අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍ර ආයුර්වේද වෛද්‍ය සභා නිල වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. (www.ayurvedicmedicoun.gov.lk)

ii. වෙබ් අඩවියෙන් ලබාගන්නා අයදුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර ගාස්තුව වශයෙන් ගෙවන ලද රු. 2,350/- ක බැංකු ලදුපත සමග ඉදිරිපත් කළ යුතුය. මෙම ගෙවීම් ලංකා බැංකුවේ (BOC) ඕනෑම ශාඛාවකින් මහරගම ලංකා බැංකුවේ ගිණුම් අංක 608003 දරන ආයුර්වේද වෛද්‍ය සභාව නමින් ඇති ගිණුමට බැරවන පරිදි ගෙවිය යුතුය. කරුණාකර අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය, මුලකුරු සමග නම සහ දුරකථන අංකය බැංකු ලදුපතේ සටහන් කරන්න.

iii. මෙම අයදුම්පත ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයට පැමිණ රු. 600/- (රුපියල් හයසීයක) මුදලක් ගෙවා ලබාගත හැකි අතර, මුදල් ඇණවුමක් මගින් ලබා ගන්නේනම් **"ලේඛකාධිකාරී, ආයුර්වේද වෛද්‍ය සභාව"** නමින් රැගෙන මාරු කරන ස්ථානය **"මහරගම"** යනුවෙන් සඳහන් කර ලබාගත යුතුය.

**සැ. යු.** මෙම අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කර භාරදීමේ දී රු. 1,750/- (රුපියල් එක්දහස් හත්සිය පනහක) ක මුදලක් ගෙවිය යුතුය.

iv. මෙම අයදුම්පත්‍ර ගාස්තුව කිසිදු අවස්ථාවක ආපසු ගෙවනු නොලැබේ.

**03. විභාග ක්‍රමය**

i. 2025.12.31 දින තෙක් බල පැවැත්වෙන පරිදි නියමිත සුදුසුකම් සපුරා වයස අවුරුදු 45 (හතළිස් පහ) ක් ඉක්මවූ අයදුම්කරුවන් වාචික පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අතර, අනෙකුත් සියලු අයදුම්කරුවන් ලිඛිත හා වාචික පරීක්ෂණ දෙකටම පෙනී සිටිය යුතුය.

ii. නියමිත දිනට සුදුසුකම් සපුරා, නිසිපරිදි සම්පූර්ණ කර අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් සඳහා වන ලිඛිත පරීක්ෂණ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් පවත්වනු ඇත.

iii. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් සහ සෘජුවම වාචික පරීක්ෂණය සඳහා පමණක් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාව මගින් වාචික පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.

iv. බාහිර බාධක නොමැති තත්ත්වයක් මත සෑම වසරකම ජූලි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා අදාළ පරීක්ෂණ පැවැත්වෙන අතර, එම දිනයන් සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව දන්වනු ලැබේ.

**04. අයදුම්පත් නිකුත් කරන හා භාරගන්නා අවසන් දිනයන්**

i. ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින් සඳහා ලියාපදිංචි අයදුම්පත් වසරේ ඕනෑම දිනක ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයෙන් හෝ නිල වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

ii. නිසි පරිදි සම්පූර්ණ කරන ලද සියලුම අයදුම්පත් අදාළ වර්ෂයේ මාර්තු 01 වන දින සිට ජූනි 30 ට ප්‍රථම ලේඛකාධිකාරී, ආයුර්වේද වෛද්‍ය සභාව, නාවින්න, මහරගම යන ලිපිනයට ගෙනැවිත් භාරදීම සහ / හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද සහ හෝ අඩුපාඩු සහිතව ඉදිරිපත් කරන අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. අයදුම්පත බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ **"පාරම්පරික (ආයුර්වේද / සිද්ධ / යුනානි) වෛද්‍යවරයෙකු වශයෙන් අලුතින් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත"** ලෙස සඳහන් කළ යුතුය.

05. පාරම්පරික (ආයුර්වේද / සිද්ධ / යුනානි) වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සියලු බලතල ආයුර්වේද වෛද්‍ය සභාව සතුය.

06. **විමසීම් - දුරකථන - 011-5672905**

**- ලිපිනය - ලේඛකාධිකාරී, ආයුර්වේද වෛද්‍ය සභාව, නාවින්න, මහරගම.**

**ආචාර්ය එම්.ඩී.ජේ. අබේගුණවර්ධන**
**ආයුර්වේද කොමසාරිස් සහ ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති**
**2021 නොවැම්බර් 17 දින**
**නාවින්න, ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේදී.**